
කවරයේ කතාව

# පරිසරය පිරිසිදු කිරීමේ දී සමාජ කාර්යභාරය



**පවතින තරගකාරී ආර්ථික රටාව තුළ මුදල ප්‍රධාන වී තිබෙන නිසා සෑම දෙනාම වෙහෙස වනුයේ හැකි පමණින් මුදල් උපයා ගැනීමටයි. එහිදී අත්‍යවශ්‍ය කාරණයක් වන කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් කා තුළත් ඇත්තේ ඉතා අඩු අවධානයකි.**

වර්තමාන ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රධාන නගරවල මෙම ගැටලුව ඉතා උග්‍ර ලෙස පවතින අතර එය ජාතික ප්‍රශ්නයක් බවට ද පත්ව තිබේ. එහෙත් සමස්ත ජනතාවගේම සහය නොමැතිව මෙම ගැටලුව විසඳ ගත නොහැකි බව සත්‍යයකි.

අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීම හා පවිත්‍රතාව තම නිවෙසින් ආරම්භ කළ යුතු ක්‍රියාවලියකි. මෙහිදී ගෘහණියගේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර පවුලේ සෙසු සාමාජිකයන් ගේ සහය ද අත්‍යවශ්‍ය වේ.

නිවෙසක් අපිරිසුදු වීමට විවිධ වූ හේතු බලපායි. මුළුතැන්ගෙයි කටයුතුවලදී ඉවත දමන අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර නොකිරීම මින් ප්‍රධාන වේ. එමෙන්ම බොහෝ නිවෙස්හි අබලි ද්‍රව්‍ය, පරණ රෙදි ආදී වූ සියල්ල නිවෙස තුළ රැස්කර ගනියි. එහෙත් නිවෙසක තිබිය යුත්තේ අත්‍යවශ්‍ය බඩු බාහිරාදිය පමණි. ඉතිරි සියල්ල ඉවත් කළ යුතුය. මෙසේ නිවෙස ඇතුළත පිරිසුදුව, පිළිවෙළට තබා ගැනීමට උත්සාහ දරන ආකාරයටම, අප මිදුල හා ගෙවත්ත ද පිරිසුදුව තබා ගැනීමට උත්සාහ කළ යුතුයි. ගෙවත්තේ ඇති ගස් නිසි පිළිවෙළට නඩත්තු කිරීම, කොළ රොඩු එක් රැස්කර පුළුස්සා දැමීම හෝ කොම්පෝස්ට් පොහොර සඳහා යොදා ගත හැකියි.

නාගරික සමාජයේ සීමිත බිම් ප්‍රමාණයක ජීවත්වන මිනිසාට තම නිවෙස පිරිසුදුව තබා ගැනීමට අවශ්‍ය වුවත්, එම කසළ බැහැර කිරීම ගැටලුවක් බවට පත් වී තිබේ. තම නිවසේ හා ගෙවත්තේ පිරිසුදුකම රැකගන්නා ඔවුහු, එකතුවන අපද්‍රව්‍ය මහපාරේ කොහේ හෝ ස්ථානයකට දමා ඒමට පුරුදු වී සිටිති. නමුත්, මෙය නිවැරැදි ක්‍රමය ද? අප ජීවත්වන නිවස මෙන්ම අවට පරිසරය ද පිරිසුදුව තබා ගැනීම

නාගරික සමාජයේ සීමිත බිම් ප්‍රමාණයක ජීවත්වන මිනිසාට තම නිවෙස පිරිසුදුව තබා ගැනීමට අවශ්‍ය වුවත්, එම කසළ බැහැර කිරීම ගැටලුවක් බවට පත් වී තිබේ. තම නිවසේ හා ගෙවත්තේ පිරිසුදුකම රැකගන්නා ඔවුහු, එකතුවන අපද්‍රව්‍ය මහපාරේ කොහේ හෝ ස්ථානයකට දමා ඒමට පුරුදු වී සිටිති.

චම්පිකා ශිරෝමාලා කස්තුරිආරච්චි

අත්‍යවශ්‍ය වේ. එහිදී පොදු භාවිතය සඳහා ඇති උද්‍යාන, මුහුදු වෙරළ, ගංගා, ඇළ, දෙළ හා වෙනත් ස්ථාන පිරිසුදුව තබා ගැනීම අපගේ වගකීමයි. නමුත් සමාජයේ බොහෝ දෙනා මෙය අමතක කරති. තම නිවසේ පිරිසුදුකම ඉහළින්ම අගයන ඔවුහු පොදු ස්ථානයකට ගිය විට එය තමන්ට අයිති නොවන දෙයක් ලෙස සිතති. විනෝදය සඳහා මුහුදු වෙරළට යන පිරිස බෝතල්, පොලිතින්වලින් අවට පරිසරය විනාශ කරන්නේ මේ නිසාය. නිවසින් රැගෙන යන අපද්‍රව්‍ය මල්ල වෙනත් ස්ථානයකින් තැබූ පමණින් ඔබේ ගැටලුව විසඳුණු බව ඔබට සිතෙන්නට ඇත. නමුත් එහිදී විසඳී ඇත්තේ එක් ගැටලුවක් පමණි. මේ පසුපස තවත් ගැටලු රාශියක් මතුවන බව අමතක නොකළ යුතුය. මේ ආකාරයට අවට පරිසරය අපිරිසුදු වීම නිසා ශරීර සුවතාවට තර්ජන ඇති වේ. බොහෝ රෝග උත්පාදනයට මෙම පරිසරයේ අපිරිසුදුතාව හේතු වේ. වර්තමානයේ ඉතා වේගයෙන් පැතිරී ගිය අතිසාරය, ඩෙංගු වැනි රෝග සඳහා ප්‍රධාන හේතුව පරිසරයේ අපිරිසිදු බවයි. තම ගෙවත්ත හා නිවස පිරිසුදු කර ගත් පමණින් මෙම රෝගයන්ට ගොදුරු නොවී සිටිය නොහැකි බව ඔබට අවබෝධ වන්නට ඇත. ඒ සඳහා සමස්ත පරිසරයේම පවිත්‍රතාව රැකගත යුතුය. ශ්‍රී ලංකාවේ කැළි කසළ අර්බුදය ග්‍රාමීය ප්‍රදේශවලට වඩා නාගරික ප්‍රදේශවල දැඩි ලෙස පවතී. මෙම අර්බුදයට ප්‍රධාන හේතු සාධක කිහිපයක් බලපා තිබේ.

* ශ්‍රී ලංකාවේ සිදු වූ ආර්ථික වෙනස්වීම් සමග පැනනැගුණු ගැටලු කල්තබා හඳුනා නොගැනීම හා නවීන කසළ කළමනාකරණ විධික්‍රම කෙරෙහි අවධානය යොමු නොකිරීම.

* වර්ෂා කාලයේ දී ඇතිවන ජලගැලීම් නිසා කසළ එකතු කිරීමට බාධා ඇති වීම.

* පසු දමා කසළ ගොඩවල් වසා දැමීමට ප්‍රමාණවත් පස් සොයා ගැනීම ගැටලුවක් වීම. (සංවර්ධිත රටවල පළමුව කසළ එකතුකර ඉන්පසු බුල්ඩෝසර් වැනි යන්ත්‍ර මගින් පොළොවට තදකර ඉන්පසු පස් තට්ටුවකින් වසා දමයි. නමුත් එය ලංකාව තුළ ක්‍රියාත්මක වන්නේ නැත.)

* අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධව පවතින නීති රෙගුලාසි වර්තමානයේ ක්‍රියාත්මක නොවීම හා ඒවා අදට ගැළපෙන සේ වෙනස් නොවීම. (කැළි කසළ බැහැර කිරීම සම්බන්ධව 1930 දී පනවන ලද නීති 1935 දී සංශෝධනය කරන ලද අතර අද දක්වාම එම නීති රෙගුලාසි බලපැවැත්වීම. නමුත් මේවා වර්තමානයට කිසිසේත් ගැළපෙන්නේ නැත.



*විවිධ දේශපාලන පක්ෂ විසින් අනුගමනය කරන ප්‍රතිපත්තිවල පවත්නා නොගැලපීම (පක්ෂ වෙනස්වීමත් සමග ඔවුන් ඉදිරිපත් කළ වැඩසටහන් වෙනස් වන අතර ඊළඟ පක්ෂය එම කාර්යය සම්පූර්ණ නොකරයි. ඔවුහු වෙනත් යෝජනා ඉදිරිපත් කරති. මේ නිසා කසළ බැහැර කිරීම සම්බන්ධ සුදුසු වැඩපිළිවෙළක් දීර්ඝකාලීනව ක්‍රියාත්මක නොවේ)

*රාජ්‍ය අනුග්‍රහය නොලැබීම

*සිවිල් සමාජය විසින් කසළ බැහැර කිරීමට දක්වන ප්‍රතිචාරය සාර්ථක ලෙස ක්‍රියාත්මක නොවීම

මෙවැනි තත්ත්වයක් පවතින රටක පෞද්ගලිකව ක්‍රියාත්මක වීම ප්‍රමාණවත් ;නාවන බවට සිතිවිල්ලක් ඇති විය හැකියි. නමුත් පෞද්ගලිකව නිසිලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම හා පරිසරය පිරිසිදුව තබා ගැනීමට උත්සාහ ගැනීමෙන් රාජ්‍ය අනුග්‍රහය ද ලබා ගත හැකි ය. ඒ සඳහා සියලු දෙනා ම ක්‍රියාමක විය යුතු ය. කොළඹ වරායේ බොහෝ කුණු ගොඩවලට කුණු දැමීමේදී බොහෝ දෙනා ක්‍රියාත්මක කරන්නේ වැරදි ක්‍රමයකි. දුර සිට කුණු විසි කිරීම මෙහිදී සුලබව දක්නට ලැබේ. මෙහිදී කුණු දැමූ පොලිතින් කවරය පුපුරා යාම නිසා කවරයේ තිබූ කුණු දසත විසිරේ. ඉන්පසු ඒවා සතුන් විසින් විසුරුවා හරිනු ලැබේ.නමුත් ක්‍රමවත් ලෙස කුණු ගොඩ අසලට ම ගොස් කුණු කවරය දැමීමෙන් මෙම ගැටලුව මතු නොවේ. එමෙන් ම කුණු කරත්තයක් හෝ තරමක් විශාල බැරලයක් තබා තිබුණ ද මෙම තත්ත්වය මෙසේ ම ය. බොහෝදෙනා එය අසලට ගොස් බඳුන තුළට කුණු ටික දැමීම වෙනුවට, වාහනයේ සිට ම හෝ එය බඳුන අසලට විසි කරති.

එහෙත් මෙහිදී බුද්ධිමත් මිනිසුන් ලෙස අප ක්‍රියා කළ යුතුය. තම නිවසේදී මෙන්ම බාහිර පරිසරයේදීත්, අප පරිසරය රැකගත හැකි ආකාරයට කටයුතු කළ යුතුය. එවිට පරිසරයේ සුන්දරත්වය රැකෙන අතරම සෞඛ්‍යය ද ආරක්ෂා වේ. එමෙන් ම නගර පිරිසිදු කිරීම සඳහා වැය කරන කෝටි ගණනක මුදල් ද වෙනත් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා වැය කිරීමට හැකි වේ. මෙහිදී නිතරම අප බැහැර කරන අපද්‍රව්‍ය කසළ බඳුන්වලට ම දමන්න. මෙය නිවසේදී මෙන්ම සේවා ස්ථානයේදීත්, එළිමහන් ස්ථානවලදීත් ක්‍රියාත්මක කරන්න.

ආහාරවලින් ඉතිරිවන ද්‍රව්‍ය කොම්පෝස්ට් බැරලයකට දැමීම ඉතා ප්‍රයෝජනවත් ය. මුළුතැන්ගෙයි ඉතිරිවන අපද්‍රව්‍ය සහ ගෙවත්තේ ඇති දිරාපත්වන අපද්‍රව්‍ය මෙසේ පහසුවෙන් කොම්පෝස්ට් බවට පත් කළ හැකි ය. ග්‍රාමීය ජනතාවට මෙම කාර්යය ඉතා පහසුවෙන් කළ හැකි අතර නගරයේ ඉඩකඩ ඇති බිම්කොටස්වල ජීවත්වන අයට ද මෙම ක්‍රමය සුදුසු ය. මෙසේ ලබාගන්නා කොම්පෝස්ට් යෙදූ විට ගහ කොළ ඉතා සරුවට වැවේ. ස්වභාව ධර්මයා විසින් ම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරන්නා වූ මෙම ක්‍රමය පරිසරයට හිතකර වේ. එමෙන්ම අපද්‍රව්‍ය බැහැර කිරීමේ අර්බුදයට ද විසඳුමකි.

වෙළෙඳ සැලෙන් නොමිලේ ලබාදෙන පොලිතීන් බෑගය භාවිතා කිරීම වෙනුවට ඔබගේ ම බෑගයක් රැගෙන යන්න. මෙහිදී රෙදි, පත් වැනි මල්ලක් යොදා ගැනීම ඉතා සුදුසු වේ. නමුත් වර්තමානයේ බොහෝ දෙනා මෙම පොලිතීන් මලුවල අවශ්‍ය ද්‍රව්‍ය ගෙන ඒමට පුරුදු වී සිටිති. මෙය පහසු වුවද පරිසරයට අහිතකර බව අමතක කරති. මෙසේ වෙළෙඳපොළට යාමේදී මෙන් ම පාසල් යන කුඩා දරුවන්ට අහාර ඔතා දීමේදීත් වෙනත් බඳුනකට දමා ආහාර දෙන්න. පොලිතීන් භාවිතයෙන් හැකිතරම් දුරට වළකින්න. එවිට නිවසේ අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු වන අතර පරිසර හානිය ද අඩු වේ.

**නිවසේ එක්වන අපද්‍රව්‍ය දීර්ඝ කාලයක් රැස් කර තබාගත නොහැකි ය. සීමිත ඉඩකඩ ඇති පිරිස මෙසේ දින ගණනාවක් අපද්‍රව්‍ය රැස්කර තබාගැනීමේ දී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එනිසා විකල්ප ක්‍රම සොයති. එහි ප්‍රතිඵලයක් ලෙස මහා මාර්ගයේ තැන තැන දිනෙන් දින අලුත් කුණු ගොඩවල් බිහි වේ.**

බොහෝ කාලයක සිට, බෝතල් පත්තරකරු සහ අතරමැදියන්, ඉවත දමන ද්‍ර ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය සඳහා බෙහෙවින් උපකාරී වී ඇත. බෝතල් පත්තරකරුවා ඉවත දමන බෝතල් පුවත්පත් සහ වෙනත් ඉවත දමන ද්‍රව්‍ය මිලදීගෙන අතරමැදියකුට අලෙවි කරයි. එම ද්‍රව්‍යවල බර සහ වර්ගය අනුව ගෙවීම් කරයි. මෙවැනි වෙළෙන්දෝ ග්‍රාමීය ප්‍රදේශවල මෙන්ම නාගරික ප්‍රදේශවල ද සිටිති. නිවසේ ඉවත දමන බෝතල්, පත්තර මොවුන්ට ලබාදීමෙන් ආර්ථික වාසියක් සලසා ගත හැකි අතර ම නිවසෙහි අපද්‍රව්‍ය ජනනය වීම අඩු කර ගැනීමට ද හැකි වේ. එමෙන්ම නාස්තිය ද වළක්වා ගත හැකි ය.

කඩදාසි අපද්‍රව්‍ය භාවිතා කොට නව කඩදාසි නැනීම කරන අතර බිඳුනු වීදුරුවලින් නව නිෂ්පාදන කළ හැකි ය. මේ සඳහා අපද්‍රව්‍ය ලබාදීමට නිවසේ එකතුවන අපද්‍රව්‍ය වෙන් වෙන් ව එකතු කිරීම ඉතා ප්‍රයෝජනවත් ය.

මෙසේ නිසි කළමනාකාරිත්වයකින් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී මහජනතාවගේ සහය මෙන් ම රාජ්‍ය අනුග්‍රහය ද සමානව තිබිය යුතුය. වර්තමානයේ නගරාශ්‍රිත නිවෙස් හිමියෝ නගර සභා ආදී වූ පළාත් පාලන ආයතන පිළිබඳ කිසිදු විශ්වාසයක් නොතබති. ක්‍රමවත් ලෙස අඛණ්ඩව අපද්‍රව්‍ය රැස් නොකිරීම මෙයට හේතුවයි. නිවසේ එක්වන අපද්‍රව්‍ය දීර්ඝ කාලයක් රැස් කර තබාගත නොහැකි ය. සීමිත ඉඩකඩ ඇති පිරිස මෙසේ දින ගණනාවක් අපද්‍රව්‍ය රැස්කර තබාගැනීමේ දී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එනිසා විකල්ප ක්‍රම සොයති. එහි ප්‍රතිඵලයක් ලෙස මහා මාර්ගයේ තැන තැන දිනෙන් දින අලුත් කුණු ගොඩවල් බිහි වේ.

නිසි දැනුවත්වීමක් කර නියමිත වේලාවක් ලබා දී අපද්‍රව්‍ය බැහැර කිරීම හා අපද්‍රව්‍ය රැස් කිරීම කරන්නේ නම් මෙම ගැටලු මතු නොවේ. එහිදී ජනතා සහාය මෙන්ම රාජ්‍ය අනුග්‍රහය ද අත්‍යවශ්‍ය වේ. ජනතාව හා පළාත්පාලන ආයතන අතර යහපත් සන්නිවේදනයක් හා අන්‍යෝන්‍ය බැඳීමක් ඇති කර ගැනීම මගින් මෙම කාර්යය සාර්ථක කර ගත හැකි ය.

පරිසරයට ආදරය කරන, සමාජයට ආදරය කරන යහපත් සිතුවිලිවලින් යුතු මිනිසුන් ලෙස ක්‍රියාකිරීමෙන් තැන තැන දැමූ කසළ ගොඩවල් නොමැති, පිරිසිදු පරිසරයක ජීවත්වෙන සෞඛ්‍ය සම්පන්න, ප්‍රීතිමත් සමාජයක් බිහි කිරීම ඉතා පහසු කාර්යයක් වනු ඇත.